# ජාතක කථාවන්හි තිරශ්චීන චරිත නායකත්වය කෙරෙහි සදුපදේශ සපයන ආකාරය

## (තෝරා ගත් ජාතක කථා කීපයක් ආශ්‍රයෙනි)

- ආචාර්ය කනංගමුවේ රාහුල හිමි[1]

## හැඳින්වීම

උපදේශාත්මක විශ්ව සාහිත්‍ය තුළ ජාතක කථාවන්ට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. සර්වකාලීන අගයකින් යුත් ජාතක කථාවන් සෑම සමාජ ස්ථරයකට ම එක හා සමාන උපදෙස් සපයයි. කාල, දේශ, භේදයකින් තොරව යහපත් සමාජ පරිසරයක් බිහි කරවීමෙහිලා ජාතක කථාවන්ගේ ආදර්ශය සුළු පටු නොවේ. බුදුන් වහන්සේගේ පූර්ව ජන්මයන් පිළිබඳව කියවෙන බැවින් මේ උපදේශාත්මක කථා "ජාතක" නමින් හැඳින් වේ. දඹදිව ජනතාව අතර පැවති කථා සමූහයකට බෞද්ධයන් ජාතක නමැති ආකෘතිය ගොඩ නගා ගත් බව මහාචාර්ය ආනන්ද කුලසූරිය මහතාගේ අදහසයි.

> "ඒ කථා බෞද්ධයන් අතර පමණක් නොව දඹදිව අන්‍ය ආගමිකයන් අතරද පැතිරෙන්නට වී බ්‍රාහ්මණ සමාජයෙහි ද ජෛන සමාජයෙහි ද ඒ ඒ ආගමිකයනට අයත් ග්‍රන්ථවල ජාතක කතාවලට තැනක් හිමි වී තිබේ. කල් යාමේදී ඒ කතා සමූහය දඹදිවින් බැහැර ගොස් දස අත පැතිරෙන්නට විය."

## ජාතක කථාවන්ගේ වස්තුවිෂය

ලෝකය පුරා ප්‍රචලිත වූ මේ ජාතක කතාවන්ගේ වස්තු විෂය විවිධය. වින්ටර්ණිට්ස් පඬිවරයා වස්තුව අනුව ජාතක කතා සත් වැදෑරුම් කොට දක්වයි. ආනන්ද කුලසූරිය මහතා තත් බෙදීම සංශෝධනය කරමින් ජාතක කතා කොටස් 06 ක් යටතේ සංග්‍රහ කොට දක්වයි.

| | |
|---|---|
| සරල උපමා කථා | උපහාස කථා |
| උපදේශ කථා | චරිතාපදාන කථා |
| විහිළු කථා | ප්‍රබන්ධ කථා හෙවත් ගද්‍ය ආඛ්‍යාන |

වස්තුවිෂය අනුව සමාජයේ සෑම පැතිකඩක් ම නිරූපණය කෙරෙන කතා ජාතක කතා තුළ ඇතුළත් බව ඉහත බෙදීම්වලින් තහවුරු කෙරේ. හාස්‍ය මෙන්ම උපහාසයද ඇතුළත් මේ කථා තුළින් උසස් ජීවන දෘෂ්ටියක් නිරූපණය කෙරෙයි. උසස් මිනිස් ගති, ඇවතුම් පැවතුම්, මෙන්ම ආකල්පයන්ගේ විනිවිද ස්වරූපයක් ධ්වනිත කෙරෙයි. ජාතක කතා තුළින් උසස් ගති පැවතුම්

[1]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

පමණක් නොව ජීවිතයේ නිතර දෙවේලේ මිනිසුන්ගේ චර්යා රටාවෙන් ඉස්මතු වන්නා වූ පහත් පෙළේ ගති පැවතුම් ද නිරූපණය කෙරේ.

මෙහිදී අපගේ උත්සාහය වන්නේ ජාතක කතාවන්හි ඇතුළත් තිරශ්චීන චරිත මගින් නායකත්වය විමර්ශනය කෙරෙන අයුරු විමසා බැලීමය. නායකයෙකු සතු නායකත්ව ලක්ෂණ ගිලිහී යන ආකාරයත්, එසේ නායකත්ව ලක්ෂණ ගිලිහී යාමෙන් ඇතිවන ප්‍රතිවිපාකත් ජාතක කතා තුළින් කදිමට නිරූපණය කොට දක්වා ඇත. මේ පිළිබඳ විමර්ශනය කිරීමට පෙරාතුව "නායකත්ව" සංකල්පය පිළිබඳවද කෙටි හැඳින්වීමක් ද අවශ්‍ය වේ.

## නායකත්වය, නායකත්වයට පත්වීම හා නායකත්ව ලක්ෂණ

ඉංග්‍රීසි භාෂාවෙන් Leader යන්නෙන් අදහස් කරන්නේ නායකයා, ප්‍රධානියා, මූලිකයා, මග පෙන්වන්නා, පෙරටුව යන්නා යන අර්ථයෙනි. LeaderShip නායකත්වය වශයෙන් ගැනේ. නායකත්වයෙහි විශේෂිත ලක්ෂණය නම් අරමුණු ඉටු කර ගැනීම පිණිස පුද්ගලයන්ගේ හෝ සමූහයකගේ චර්යාව කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාවයි. ශාරීරික ස්වභාවය, බුද්ධිය, සමාජශීලී බව, අවංකකම, දරාගැනීමේ හැකියාව, පෞරුෂත්වය, සුපරික්ෂාකාරී බව, නිර්භීතකම, විශ්වාසී බව, තීරණ ගැනීමේ හැකියාව, ක්‍රියාශීලී බව, සාධාරණත්වය, නිර්මාණශීලී බව, කළමනාකරණය, සවන් දීම හා ආත්ම විශ්වාසය, නායකත්වය තීරණය කිරීමේ සාධක ප්‍රධාන වේ. රටක හෝ සමාජ කණ්ඩායමක යමෙකු නායකත්වයට පත්වෙන අවස්ථා 04 ක් හඳුනා ගැනීමට පුළුවන. එනම්

බලය යොදා නායකත්වයට පත්වීම
පාරම්පරිකව නායකත්වයට පත්වීම
නිල බලයෙන් නායකත්වයට පත්වීම
සමාජයේ අවශ්‍යතාව හා ඉල්ලා සිටීම මත නායකත්වයට පත්වීම

මේ නායක කණ්ඩායම් හතර මෙසේ හඳුනා ගැනීමට පුළුවන.
ඒකාධිපති නායකත්වය - නායකයා සියලු තීරණ ගනී
සහභාගිත්ව නායකත්වය - කණ්ඩායමක් වශයෙන් සහභාගී වී තීරණ ගනී
නිදහස් නායකයින් - සාමාජිකයන්ට නිදහස් තීරණ ගැනීමට ඉඩහරී
ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් - සාමූහික නායකත්වය මත තීරණ ගනී

කෙබඳු ආකාරයක නායකයන්ට වුවද, පොදුවේ පිළිගත හැකි නායකත්ව ලක්ෂණ බුදු දහමින් අනාවරණය කෙරේ. පවුලේ සිට රටක, රාජ්‍යයක නායකයෙකු අනුගමනය කළ යුතු ගුණාංග සූත්‍ර ධර්මවලින් ඉස්මතු කොට දක්වා ඇත. සිගාලෝවාද සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, කූටදන්ත සූත්‍රය, පච්චනීක සූත්‍රය, අජ්ජාන සූත්‍රය, සුභාසිත සූත්‍රය නිදසුන්ය. මේ ධර්ම කරුණුවලින් යහපත් ක්‍රියාවන්හි නිරත වීම, බුද්ධිමතෙකු වීම, බහුශ්‍රැතයෙකු වීම, විමසා බලා කටයුතු කරන්නෙකු වීම,

අධිමානයෙන් තොර වීම, හා මහා ප්‍රාඥයෙකු වීම යනාදී ගුණයෙන් නායකයෙකු සමන්විත විය යුතු බව පැවසේ.

## නායකත්වය සඳහා ජාතක කතාවන්හි තිරශ්චීන චරිත සපයන සදුපදේශ

තෝරා ගත් ජාතක කථා කීපයක් ආශ්‍රයෙන් එහි තිරශ්චීන චරිත නායකත්වයට උපදෙස් සපයන ආකාරය පිළිබඳව විමසා බැලීම මෙහි මූලික අධ්‍යාශයයි. ඒ අනුව තෝරා ගත් ජාතක කතා කීපයක් ආශ්‍රයෙන් තත් සදුපදේශ කවරේදැයි මෙහිදී අවධාරණය කෙරේ. රජුගේ රථයේ සැදූ සම් හා වරමදු කැවේ නගර වාසී සුනඛයන් යැයි සිතා රජු ඒ සියලු සුනඛයන්ට මරණීය දණ්ඩනය නියම කළේය. බෝසත් සුනඛයා ඉදිරිපත් වී සත්‍ය පහදා දුන් ආකාරයත්, වැරදි කළ වුන් තමා සමීපයේ ආරක්ෂාකාරීව සිටින බවත්, යුක්තිය හා සාධාරණය රජෙකුගෙන් සැමට පොදුවේ ඉටුවිය යුතු බවත්, ඉගැන්වෙන ජාතක කතාවකි කුක්කුර ජාතකය. එහි අවසානයේදී බෝසත් සුනඛ තෙම රජුට මෙසේ අවවාද කරන්නේය.

> "රජ්ජුරුවන් නම් කාරණා කාරණා පරීක්ෂා කොට තරාදියක් මෙන් මධ්‍යස්ථ වන්ට වටනේය....."

රජු වනාහි කාරණා කාරණා පිළිබඳ පරීක්ෂා කොට තීරණ ගත යුතු අයුරු මේ ජාතක කතාවෙන් කීවේ වන. විමංශනයෙන් තොර තීරණය අසාධාරණ වන බවත් එය එක් පාර්ශවයකට හානි කරන බවත් එවැනි තීරණ ගැනීම නුසුදුසු බවත් එම ජාතක කතාවෙන් ධ්වනිත කෙරෙයි. එසේම වැරදි කරන අය රජු සමීපයේ සිටිමින් රැකවරණය ලැබ යෙහෙන් වැජඹෙන බවද මේ ජාතක කතාවෙන් ප්‍රකාශිතය. වර්තමාන රාජ්‍ය හා ආයතන නායකත්වයට ඉතාමත් අගනා උපදේශ සහිත ජාතක කතාවක් වශයෙන් මේ ජාතක කතාව හැඳින්වීමට පුළුවන.

තවද භෝජාජානීය නම් බෝසත් අශ්වයා සතුරු රජදරුවන් සත් දෙනා පරාජය කොට තම ස්වාමි රජතුමාට ජයග්‍රහණය ලබා දීමෙන් පසුව රජුට ධර්මාර්ථයෙන් අවවාද කරන්නේ මෙසේය.

> "තොපිද නො පමාව දන්දෙව, පෙහෙවස් රකුව, බණ අසව, ප්‍රජාවධ නො කරව, දසරාජ ධර්මයෙන් අවවාද කොට ....."

නායකයෙකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග ක්‍රියාවට නැංවීමෙන් සමෘද්ධිය සිද්ධවන බවත්, ගුණය පසෙක ලා බලය රැක ගැනීමට පමණක් උත්සාහ කිරීම විනාශයට හේතුවන බවත් මේ ජාතක කතාවෙන් ප්‍රකාශිතය. එමතුද නොව තම ස්වාමි පුරුෂයාට පිහිට විය යුතු තැන පළා නො යමින් හිද උපකාර කළ යුතු බවත් එය උත්තම ගුණ ධර්මයක් බවත් ප්‍රකාශිතය.

නායකත්වයක තිබිය යුතු උත්තම ගුණාංග නිරූපණය කෙරෙන වැදගත් ජාතක කතාවක් වශයෙන් නළපාන ජාතක කතාව දැක්විය හැකිය. වඳුරු කුලයෙහි උපන් බෝසත් තෙම

රක්ෂාධිගෘහිත විලෙන් ජලය පානය කොට තම පරිවාර වඳුරු සේනාවද ආරක්ෂා කරගත් ආකාරය එයින් කියැවේ. නායකයා වනාහි විමසිලිමත් විය යුතුය. එමතුදු නොව උපායශීලි විය යුතුය. අවශ්‍යතාව ජයග්‍රහණය කර ගැනීමට උපායශීලීව කටයුතු කිරීම වැදගත් නායකත්ව ලක්ෂණයකි. සිදුවිය හැකි අන්තරාය බොහෝ විපත් නැති කර ගැනීමට විමසා බලා කටයුතු කිරීම නායකයෙකු සතු ලක්ෂණයක් බව තත් වානර බෝසත් චරිතයෙන් සදුපදේශ සපයයි.

තවද නායකත්වය දුරදිග නො බලා කටයුතු කරන අමනෝඥයෙකු අතට පත්වීමෙන් විනාශය සිදුවෙන බව ආරාම දූසක ජාතකයෙන් පෙනේ. වැරදි උපදේශය හා අවවාදය සියල්ල විනාශ කරන බව එයින් ගම්‍ය කෙරේ.

> "ඉක්බිත්තෙන් ඔවුනට වානර රජ තෙම කියනුයේ පින්වත් වූ වානරයෙනි ජලය නම් රක්ෂා කට යුත්තේය. තෙපි පැල ගස්හි ජලය වත් කරන්නා වූ ගස් උපුට උපුටා මුල් බලා ගැඹුරුව ගිය මුල්හි බොහෝ ජලය වත් කරව. ගැඹුරුව නො ගිය මුල්හි ස්වල්පයක් වත් කරව. පසුව අපට ජලය ලැබ ගත නො හැක්කේ යැයි කීයේය."

අනර්ථයෙහි දක්ෂයා අර්ථයෙහි සුව එලවන්නේ නොවෙයි. එසේම නුවණ නැති තැනැත්තේ වැඩ පිරිහෙලන්නේය යන සදුපදේශ ආරාම දූසක ජාතක කතාවෙන් කීවේ වන. අදක්ෂ, විමසීමෙන් තොර, නායකත්වය සියල්ල විනාශ කරන්නේය.

ප්‍රිය තෙපුල් බිණීමත්, සවන්දීමත්, නායකයෙකු සතු උසස් ගුණ ධර්මයකි. නන්දිවිසාල ජාතකය, මහිලාමුඛ ජාතකය, කණ්හ ජාතකය, නිරූපණය කරන්නේ එවැනි අවස්ථාවකි. සේවය ලබාගත යුත්තේත් එම සේවයෙන් පසුව ඇගයීමට ලක් කළ යුත්තේත් පළමුවෙන් ප්‍රිය තෙපුල් වචනයෙන් ආමන්ත්‍රණය කිරීමෙනි. නායකයෙකු එසේ කටයුතු කිරීමෙන් අපේක්ෂිත ඵල සාධනය සිදුවන බව තත් ජාතක කතා මගින් පැහැදිලි කෙරෙයි. අවවාද දිය යුත්තේ ආදර්ශයෙන්ය. එසේ නො වීමෙන් තමාටම විනාශය සිදු වෙයි. සකුණ ජාතකයෙන් කියන්නේ ආදර්ශයෙන් අවවාද දීම උතුම් බවයි.

> "මේ මගට අන්‍ය පක්ෂී කෙනෙකුන් වැද්ද නො දෙමියි සිතා පක්ෂීන්ට පලා ගොස් අසවල් මාවත ඇතුන් අසුන් රථ අදින ගොස් ආදීන්ගෙන් උපද්‍රව බොහෝ යයි කියන්නීය....බෝධි සත්වයෝ පක්ෂි ගණන පිරිවරා ආකාශයෙන් යන්නාහු පක්ෂීන් සමන්වා මෙ කියන පක්ෂි ධේනුව බලා මහ මාවත මිය පියා වැද හොත්තී දැක අනුන්ට අවවාද කියා තෘෂ්ණාවට වසඟව මළා යැයි වදාරා...."

කාක ජාතකය, ගෝධ ජාතකය, සිගාල ජාතකය, ගුණ ජාතකය ආදි බොහෝ ජාතක කතාවන්ගේ තිරශ්චීන චරිත නායකත්වය සඳහා සදුපදේශ සපයන බව පෙනේ. සිය ගෘහයෙන් ආරම්භව රටක රාජ්‍ය පාලනය දක්වා වූ විවිධ අවස්ථාවල හා සමාජ සංස්ථාවල විවිධ ආකාරයේ නායකත්ව ලක්ෂණ සඳහා අවැසි කරන මූලික ලක්ෂණ මෙම ජාතක කතාවන්ගෙන් උද්ධරණය

වන්නේය. ජාතක කතා බොහෝමයකින් මේ ලක්ෂණ ඉස්මතු කොට ඇතත් ඒ සියල්ල ගෙනහැර දැක්වීමට මෙහි අවකාශ නැත්තේය. යහපත් පාලකයෙකු තුළ තිබිය යුතු උත්තමාංග මිනිස් සමාජයෙන් ගිළිහී යාම හා ඒ සඳහා උපදෙස් සැපයීමට තිරශ්චීන චරිත යොදා ගැනීම තුළින් සියුම් උපහාසයක් සමග උපදේශ සපයන බවක් ජාතක කතාවන්ගෙන් ඉස්මතු කෙරෙයි. තිරශ්චීන චරිතයන්ගෙන් නායකත්වය සඳහා සපයන මේ සදුපදේශ සර්වකාලීන අගයකින් යුක්ත බව වර්තමාන සමාජය දෙස බැලීමෙන් තහවුරු වේ.

ශ්‍රී ලාංකේය සමාජයේ ප්‍රාථමික ඒකකයේ පටන් විස්තීරණ සමාජ රටාව දෙස බලන විට විවිධාකාර නායකත්ව ලක්ෂණ දක්නට ලැබෙයි. විශේෂයෙන් ම ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායෙන් පෝෂණයලත් ශ්‍රී ලාංකේය ජන සමාජයේ නායකත්ව ලක්ෂණ වඩාත් නැඹුරු විය යුත්තේ කවර පැත්තකටද යන්න අප කා තුළත් අවබෝධයක් තිබිය යුතුය. ග්‍රාමීය, නාගරික, පළාත් හා රාජ්‍ය මට්ටමේ නායකත්වයත්, ආගමික හා විවිධ සමාජ කණ්ඩායම් නායකත්වයත් මේ වන විට ථෙරවාදී බුදුදහමට අනුගත නොවන බවක් දක්නට ලැබෙයි. ඇතැම් බෞද්ධ ආගමික නායකත්ව කණ්ඩායම් තුළ ද අනවශ්‍ය බලපෑම් නායකත්වයන් දක්නට ලැබේ. එය ථෙරවාද බුදුදහමේ චිරස්ථිතිය සඳහා යම් අහිතකර බලපෑම් ඇති කෙරේ. මේ සෑම නායකත්වයකට ම ජාතක කතාවන්ගේ තිරශ්චීන චරිත සදුපදේශ සපයන ආකාරය ඉහත තොරතුරුවලින් අනාවරණය කෙරේ.

## පර්යේෂණ විධික්‍රමය

ජාතක කතාවන්හි ඇතුළත් තිරශ්චීන චරිත පිළිබඳ අවධානය යොමු කරමින් එයින් නායකත්වය සඳහා උපදෙස් සපයන ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මකව විමසා බැලීම. ජාතක කතාවන්හි තිරශ්චීන චරිත නායකත්ව ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා පිළිබඳ තත් ලක්ෂණ නායකයෙකු පිළිපැදිය යුතු ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීම හා චරිත විශ්ලේෂණාත්මක අධ්‍යයනය ප්‍රධාන විධික්‍රමය වේ.

## පර්යේෂණයේ වැදගත්කම

නායකත්වය සෑම සමාජයකම දක්නට ලැබේ. අදූරදර්ශී වැරදි නායකත්වය තත් සමාජයට ම වැරදි ප්‍රතිඵල අත් කර දේ. නායකයෙකු වශයෙන් අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියා පටිපාටිය පිළිබඳ යම් පමණකට අවබෝධයක් මෙම පර්යේෂණයෙන් ලබා ගැනීමට පුළුවන. ලෝකයේ විවිධාකාර නායකත්ව ලක්ෂණ දක්නට ලැබේ. ඒ සියලු නායකත්වයන්ට බලපාන උපදේශ පිළිබඳ කෙටි විමර්ශනයක් මෙම පර්යේෂණයෙන් එළි දැක්වෙන බැවින් මෙය සර්වකාලීන වැදගත්කමකින් යුක්ත පර්යේෂණයක් වනු ඇත.

**ප්‍රමුඛ පද:** ජාතක කතා, නායකත්වය, තිරශ්චීන, චරිත, සදුපදේශ

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුලසූරිය, ආනන්ද, *සිංහල සාහිත්‍ය* IV (1997). බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ. පිටුව. 01.

*සිංහල - ඉංග්‍රීසි ශබ්ද කෝෂය.* (2000). පී.ජී. මලලසේකර. කොළඹඃඇම්.ඩී. ගුණසේන හා සමාගම. පිටුව. 579.

පෙරේරා, චන්දිම.(2003).*නායකත්වය සහ කළමනාකරණය.*වැල්ලම්පිටිඃ යලස්සන මුද්‍රණ ශිල්පියෝ. පිටු. 25, 26.

*ජාතක පොත් වහන්සේ.* (2000)නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.පිටුව. 114.